

# සිංහරාජ ගවේෂණය

කර්තෘ - සචිදි සහස්නා දිසානායක.

# සිංහරාජ ගවේෂණය

සව්දි සහස්නා දිසානායක
(කර්තෘ)

කර්තෘගේ වෙනත් කෘති-
අමුතු සිහිනය

පාසල- මහ/ මහාමායා බාලිකා විද්‍යාලය
පන්තිය- 10 B

කෘතිය පළ කරන දිනය -2026-05-10

ISBN අංකය - 978-624-208-915-7

# පිදුම

මෙම E-book වැඩසටහන සංවිධානය කළ අප පාසලේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලයට ද , මාගේ දෙමව්පියන්ටද ,මාගේ සොහොයුරියන්ටද ,නන්  අයුරින් සහාය වූ සියලු දෙනාටම ස්තුතියක් වශයෙන් මෙම පොත පුදමි...



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුහවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා , නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය
විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව , විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම

ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# (01)

ජෙනී,ලිලී සහ ලූක් යනු සත්ව ගවේෂකයන්.ඔවුන් ඇමරිකානු සත්ව ගවේෂණයන්ගේ මූලික තිදෙනායි.

එක් දිනක් ජෙනී " අප්පෝ! ඇති යන්තම් අද වැඩ නෑ" එවිට කියූ විටම ලුවිස් එතනට පැමිණ "ආ.කවුද වැඩ නෑ කිව්වේ? මෙන්න අලුත් projet එකක්" කියා කිව්වේය.
" මීට වඩා හොඳයි බේකරියක වැඩක් කරගෙන හිටියනම්,නිදහසේ ඉන්න තිබ්බා.මට නම් බැරියෝ......කියමින් ජෙනී පුටුව මත හාන්සි විය.
"අනේ මං දන්නෑ" කියමින් ලිලී projet එක අතට ගත්තේ ය. " ආ..මේක මේ සිංහරාජ වනාන්තරේ ගැන project එකක්.මේකට නම් ලංකාවට යන්නම වෙනවා,ඉන්න මම මේක කියවන්නම්"එසේ කියූ ලිලී project එක කියෙව්වේය.

" සිංහරාජ වනාන්තරයේ දුර්ලභ  කටුස්සන් විශේෂයක්ගේ කටුස්සන් 5 පමණ  අස්ථි කොටස් නැතිවී ඇත.ඔවුන් මරා ඔවුන්ගේ අස්ථි රැගෙන තිබේ.ඒ පිළිබඳව එම ස්ථානයට ගොස් පරීක්ෂණ කර වාර්තාවක් ලබා දෙන්න"

"අපිට සිංහරාජ වනාන්තරය නම් කවදාවත් පරීක්ෂණයක් කරන්න හම්බෙලා නෑ. එක හින්දා මේක ත්‍රාසයජනක වෙයි" එය කියවා ලිලී ලංකාවට යෑම සඳහා බඩු ලෑස්ති කිරීමට තම කාර්යාලය වෙත ගියේය. එවිට ජෙනී " කමක් නෑ කොහොමත් කාලෙකින් කොහෙවත් ගියෙත් නෑනේ. ඒ හින්දා ඔන්න ඔහේ ඒකත් හොඳයි" කියා ජෙනීද ලංකාවට යෑම සඳහා බඩු ලෑස්ති කිරීමට ගියේය." ආ හරි එහෙනම් මම අපිට නතර වෙන්න හොඳ හෝටලයක් හොයන්නම් ඉන්න මම දැම්මම බලන්නම්" කියා ලූක් එය සෙවීමට  පටන් ගත්තේය.
" මං හිතන්නේ මට හොඳ තැනක් හම්බුනා.එතන නම...ඉන්න බලන්න..ආ එතන නම Heritage Tremternt .එතන අපිට නතර වෙන්න හොඳයි වගේ,හරි ජෙනී  මම හොටෙල් එක book කරා.
එවිට ජෙනී " හරි අපි එහෙනම් හෙටම මේ වැඩේට යමු'

# (02)

මෙම කාර්යය සඳහා පිටත්වීම සඳහා ඔවුන් ඊළඟ දින උදෑසනම ගුවන් යානයට නැගී ලංකාව බලා පිටත් විය.

හෝටලය සොයා ගිය ජෙනී ,ලිලී සහ ලූක් අවසානයේ හෝටලය සොයාගත්තේය.හෝටලයේ එදා දිනයේ රෑ පහන් කළ ඔවුන් තිදෙනා  ඊට පසු දින සිට කාර්ය ආරම්භ කළේය.
ඊට පසු දින මූලස්ථාන මූල්ය  ගවේෂකයා වන මිස්ටර් . නොවර් හමුවීමට මේ තිදෙනා ගියහ.

එහිදී කටයුතු කළ යුතු ආකාරය  මිස්ටර්.නොවර් ඔවුන්ට කියා දුන්නේය.



සියල්ල දැනගත් ගත් ලුක්,ජෙනී සහ ලිලී සිංහරාජ
වනාන්තරයට යෑම සඳහා පිටත්විය.
මඟ දිගට ඇසුණු බය උපදවන ශබ්ද,ගස්
සෙලවෙන හඬ,විවිධ සතුන් කෙරෙහි බිය නොවූ ඔවුන්
තිදෙනා මෙම පරීක්ෂණය සාර්ථක කර ගැනීමට කටුස්සන්
විශේෂ සොයා පිය මැන්නේය. සියලු ලක්ෂණ සටහන් කර
ගත් ලූක් ,ජෙනී හා ලිලී සමග ඉදිරියටම ගියේය.
එක්වරම ලිලී  නතර වී එවැනි ලක්ෂණ සහිත කටුස්සෙකු
සිටින බව අනික් දෙදෙනාට පැවසීමත් සමඟ ඔවුන් ද ඒ
පිළිබඳ සොයා බැලීය.අවසානයේදී එම ලක්ෂණ සහිත
කටුස්සා සොයාගැනීනි.



# (03)

එය  ලංකාවේ ඇති කාර්යාලයට රැගෙන ගිය මොවුන් තිදෙනා පරීක්ෂණ කිරීමට පටන් ගත්තේය.



" මේ වනාන්තරයේ කටුස්සන්  තමයි නැතිවෙලා තියෙන්නේ. ඒ වගේම මේ නැති
වෙලා තියෙන කටුස්සන් 5දෙනාගේමත් එකම අස්ථි කැබැල්ල තමයි නැතිවෙලා තියෙන්නේ.  ඒත් මට තියෙන එකම ප්රශ්නය තමයි මට එක කටුස්සෙක් විතරක් කොහොමද හම්බවුණේ කියන එක අඩුම තරමේ කටුස්සන් දෙදෙනෙකුවත් හම්බෙන්න ඕන. මෙතන මොකක් හරි දෙයක් තියෙනවා. මං හිතන්නේ දැන් පරීක්ෂණ කිරීම ආරම්භ කරොත් හොඳයි" එසේ කිවේ ලිලීය.

"ලිලී ඔයාට හිතෙන්නේ නැද්ද මේකෙ මොකක් හරි වැරැද්දක් තියෙනවා කියලා"එසේ කීවේ ලූක් ය."ඔව් ලූක් මටත් හිතෙනවා ඒකම, මොකද අපි ගෙනාව කටුස්සන් දෙදෙනාගෙම එකම අස්ථිය නෙවෙයි නැතිවෙලා තියෙන්නේ. ඒ වගේම එකිනෙකට තියෙන ජානත් වෙනස්" .ලිලීගේ දළ සටහන වැරදි බව ඇයටම තේරීම් ගියේය.එවිට ලිලී එක්වරම පැමිණ"මටත් හිතෙන්නේ ඕකමයි. ඕකෙ මොකක් හරි වැරැද්දක් තියෙනවා.අපි ආයෙත් පරීක්ෂණයක් කරමු. අපිට මේක හොයාගන්න පුළුවන් වෙයි" එසේකියූ තිදෙනා නැවතත් පරීක්ෂණය කිරීමට පෙලඹිණි.

නැවත නැවතත් පරීක්ෂණ කරත් නිවැරදි ප්රතිඵලය නොලැබෙන නිසා එය අසාර්ථක විය."ලිලී ඔයාට හිතෙන්නේ නැද්ද අපි වැරදි දෙයක් ගැන තමයි මේ හොයන්නේ. අපි නැවතත් වනාන්තරයට ගිහිල්ලා මේ ගැන හෙව්වොත් නරකද?මම නම් හිතන්නේ ඒක තමයි හොඳම විසඳුම"එසේ කීවේ ජෙනී." ඔහු ජෙනී  ඒක නං ඇත්ත තමයි" එසේ කීවේ ලූක් ය.අපි හෙට ආපහු පරීක්ෂණ කරන්න යමු,ඊට පස්සේ මුල ඉඳන් පරීක්ෂණය ආරම්භ කරමු" ජෙනී  එසේ කිව්වේය. "ඇත්ත තමයි එහෙනම් අපි දැන් නිදාගමු හෙට උදේට අපි ආපහු යං පරීක්ෂණය කරන්න "ලිලි එසේ කියා නින්දට ගියේය.

# (04)

නැවතත් පරීක්ෂණය ආරම්භ කිරීමට සිංහරාජ වනාන්තරයේ සිතියම අතට ගත් මොවුන් දෙදෙනා සිංහරාජ වනාන්තරය බලා පිටත් විය.



" හරි අපි එහෙනම් දැන් පරීක්ෂණය ආපහු පටන් ගමු"දැඩි අධිෂ්ඨානයෙන් යුතුව ලිලී කීවේය."ඔව් අපි පටන් ගමු"අනෙක් දෙදෙනාද ඊට එකඟ විය."මේ එක වගේ කටුස්සන් හුඟ දෙනෙකුගේ කොටස් ඇයි මේ පාර තියෙන්නේ?දැන් දෙතුන් දෙනෙක්ම මම දැක්කා, ජේනී ලිලී මං හිතන්නේ මේ කටුස්ස තමයි ඔය අපිට පරීක්ෂණය කරන්න හම්බුනේ?"ලූක් දිනපොතේ සටහන් කර ගනිමින් කීවේය ."ඔව් ඇත්ත තමයි ඒ ලක්ෂණත් ඒ විදිහටම තියෙනවා.අපි බොරුවටනේ බොරුවටනේ. අර වෙන කටුස්සෙක් පස්සෙ ගිහින් තියෙන්නේ"සතුටින් ලිලී පැවසුවේය.

" ඔව් ඒක ඇත්ත එවුනාට මෙච්චර ඉක්මනට මේක හම්බෙනවා කියන්නේ මෙතන මොකක් හරි දෙයක් තියෙනවා"ජෙනී සැකයෙන් කීවේය."ඒකෙත් ඇත්තක් තියෙනවා හැබැයි"ලූක් කීවේය.

එසේ සිතා එය ගණන් නොගෙන ඔවුන් නැවතත් කාර්යාලයට යෑමට පිටත්වීමට ගියය අතරතුර කවුරුන් හෝ කතා කරන ශබ්දයක් ඔවුන්ට ඈතින් ඇසිණි. "මේ මහා භයානක කැලේ කවුද මේ කතා කරන ශබ්දයක් ඇහෙන්නේ"ලිලී තිගැස්සිණි."මට හිතෙනවා මේ සිදුවීමටත් මේ දේ මොකක් හරි සම්බන්ධයක් ඇති කියලා"ලූක් කීවේ ඉස්සරහට යන්නට සූදානම් වෙමිනි."ඒත් අපි යන එක භයානක නැද්ද?"එසේ කීවේ ජෙනිය.නැහැ. "අපි යමු මට හිතෙනවා අපිට මේක ඉක්මනට හොයාගන්න පුළුවන් වෙයි කියලා."නිර්භීතව නැගී සිටියේ ලූක් කීවේය.

# (05)

"තිදෙනාම සෙමින් සෙමින් ඉදිරියට ඇදිනි.නිර්භීතව ලූක් ඉදිරියට ගියද ලිලි සහ ජෙනි බියව පිටිපස්සෙන් ගියේ, කුමක්ද ඊළඟට සිදුවන්නේ යැයි සිතමිනී.

එක්වරම මිනිසුන් දෙදෙනෙක් කතා කර කර සිටින බව ඔවුන් දුටුහ.ඔවුන් බිය නොවී ඉදිරියට ගිය හ.එක්වරම ඔවුන් ලිලී,ජෙනී සහ ලූක්ව දුටුවේය.ඔවුන් තිදෙනා පසුපස පැන්නූ අතර මොවුන් තිදෙනා දිව ගියේ සියලුම උපකරණ අතැතිවයි.



ඔවුන් කාර්යාලයට දිවගියහ.පසුව ඔවුන්ට එම මිනිසුන් දෙදෙනා මගහැරුණි.පණ බේරා ගත් සතුටින් සිදුවූ සියල්ල මිස්ටර් නෝවර්ට පැවසූ අතර මිස්ටර් නොවර් ද සිදු වූයේ කුමක්ද යන්න සිතීය.

පසුව රැගෙන යා කටුස්සාගේ පරීක්ෂණ සිදු කිරීමේදී නිවැරදි ප්‍රතිඵලයක් ලැබුණු අතරින් නිගමන කීපයක් ද ලිලී ඇතුළු කණ්ඩායම අනුමානය කළහ.මිස්ටර් නෝවර් අසලට ගිය මොවුන් තිදෙනා "මිස්ට නෝවර් ඔන්න අපි පරීක්ෂණයේ සාර්ථකව ඉවර කරා. මේකෙන් මේ කටුසු ජාතියකගේ කටුස්සන් පස්දෙනාගෙම එකම අස්ථිය අරගෙන තියෙන්නේ. ඒ වගේම අපි හිතුවා වගේම මේ කටුසු විශේෂයගේ අස්ථි ඉතා ඉහළ මිල ගණන්වලට ජාත්‍යන්තර වෙළඳපොළ පවා තිබුණත් ඒය තහනම් දෙයක්.." එසේ පැහැදිලි කළේ ලූක් ය. "ඕ එහෙමද ඔයාලා හිතන්නේ මේ අස්ථි කවුරු ගන්න ඇතිද කියල?" මිස්ටර් නෝවර් කීවේය. " අන්න,මිස්ටර් නොවර් ඒක තමයි අපේ අන්තිම point එක.අපිට ඒක තාම විසඳගන්න බැරි වුණා" ලිලී කීවේ දිනපොත අතට ගනිමිනි.
පසුව ලිලී සහ ලූක් වාර්තාව සකසමින් සිටින අතරතුර ජේනී එතනට පැමිණ "ඔයාලට හිතෙන් නැද්ද අපි පිටුපසාව අයවෙන්න බැරිද ඔය අස්ථි කොටස් හොරකම් කලේ? "ජේනී කීවේ පරීක්ෂණයේ අන්තිම අදියරටම පැමිණ ය " මට ඒක නම් හිතුනෙම නෑ. ඒක වෙන්න පුළුවන්" එසේ කියූ ලිලී ලූක් සමග මිස්ටර් නොවර්ට මේ පිළිබඳව කියූ විට ඔවුන්ද මේ පිළිබඳද සිතීය." අපි එයට ගිහින් එහෙනම් එයාලව අල්ලගමු."එසේ කීවේ මිස්ටර් නොවර් ය.

# (06)

ඊළඟ දිනයේ සිංහරාජ වනාන්තරයට පොලිස් කණ්ඩායමක් සමග සමග මොවුන් ගිය අතර එවිට යම්කිසි පුද්ගලයෙන් අස්ථි පරීක්ෂණ කරමින් සිටිය අතර පොලිස් කණ්ඩායම ඔවුන්  අත්අඩංගුවට ගත්තේය.සියල්ල සාර්ථකව විසඳා ඔහු පරීක්ෂණ කරමින් සිටි උපකරණ හා ද්‍රව්‍ය ඇමෙරිකානු සත්ව ගවේෂණ මධ්‍යස්ථානයට යවා ඔවුන් ද ඇමරිකා සත්ව මධ්‍යස්ථානයට යෑමට ගුවන් යානයට නැගීමට පිටත් විය.

ගුවන් යානයෙන් නැගීමට පෙර මිස්ටර් නොවර්  "ස්තූතියි අපට උදව් කරාට. ඔයාලා සාර්ථකව වාර්තාව හැදුවා. ඒකට නැවතත් ස්තූතියි. ගිහින්එන්න." යනුවෙන් මිස්ටර් නොවර්  ඔවුන්ගෙන් සමු ගත්තේය.
පසුව ඔවුන් ඇමරිකාව බලා පිටත් වීමට ගුවන් යානයට නැගීය.

ඇමරිකාවට ගුවන් යානයෙන් ගොඩ බැස මොවුන් තිදෙනා මධ්‍යස්ථානය වෙත ගියේ තවත් ගවේෂණයක් අවසාන යැයි සතුටු වෙමිනි.
"අප්පේ!දැන් නම් ඉවරයි. දැන් නම් ටිකක් නිදාගන්න ඕන"ජෙනී කී අතර ලුවිස්  එවිට එතනට පැමිණ"ඔන්න මං ආවා ,ඔයාලට මගෙන් සුභ පැතුම්!ඒ වගේම මං අරන් ආවා අලුත් ගවේෂණයක්"කීහ.

" අනේ මං දන්නෑ . මට නම් දැන් එපා වෙලා තියෙන්නේ. එකක් ඉවර වෙද්දි එකක්,මට බැරියෝ! " කියමින් ජෙනී කෑ ගැසීය.

# -නිම්-

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාත්‍ය)